ම්භතෙරුන් විනය විචාළසේක, ඒ තෙරනුවෝත් සඞ්ඝසම්මත යෙන්ම විසඳූහ, "වහන්ස ශෘංගී ලවණ කල්පය කැපද? ඇවැත්නි ඒ කවරේද? "ස්වාමීනි අඟින්කළ කුලාවෙක බහා ලුණුනැති ආහාර ලත්කල මිශ්‍රකොටගෙණ වළඳනා පිණිස ලුණුපරිහරණය සිඞ්ගිලොණකප්ප නම් "ඇවැත්නි කැපනොවේ "කොහිදී මෙය ප්‍රතික්ෂෙපකරණලදද? සැවැත්නුවරදී ප්‍රතික්ෂිප්තයි, ඒබව මහාවිභඞ්ගයෙහි ආයේය, එසේ කරන්නා කවරවරදකට පැමිණේද? සන්නිධිකාරක භොජනයෙහි පචිතිඇවතට පැමිණෙයි. එකල රේවතතෙරුන්වහන්සේ "වහන්ස සඞ්ඝතෙමේ මාගේයන්නක් අසාවා, මේ පළමුවෙනි වස්තුව සඞ්ඝයාවිසින් විනිශ්චයකරණලදී, මෙසේත් මේ වස්තුව ධම්මයෙන් විනයෙන් බුදුසස්නෙන් ඉවතය මේ පළමුවෙනි සලාකාව තබමි" වදාළසේක.

මේ ක්‍රමයෙන් ඉතිරි නවයෙහිත් විනිශ්චය දතයුතුයි. මෙහි ද්වඞ්ගුලකප්පනම්, ඉරහැරී දෑඟුලක් සෙවනැල්ල වැඩෙනතුරු විකල්භොජුන් කැපය යුතුයි, මෙද පචිතිඇවැත්කරයි, ග්‍රාමන්තරකප්පනම් පවාරිතවූ යමෙක් අන්ගමකට යනසිතින් කැපනොකොට ආහාරවැළඳීමයි, මෙද පචිතිඇවැත්කරයි, ආවාස කල්පනම්, නානා ආවාස ඇති එක්මහ සීමාවෙක වෙන් වෙන් උපෝසථකර්මයි, එය උපොසථක්ඛන්ධකයෙහි දුකුලාබැව් වදරණලදී, අනුමතිකල්පනම්, සතරවැන්නෙහි කිපරිද්දෙන්ම වෙනුවෙනු ආවාසයන්හි වසහවූ සඞ්ඝයා විසින් විනය කටයුතු කිරීමයි, මෙද චම්පෙය්‍යක්ඛන්ධකයෙහි කිපරිද්දෙන් දුකුලායි, ආචිණ්ණකප්පනම්, ගුරුඋපාධ්‍යායන් විසින් කළදෙයක් කැපය යුතුයි, යමක් ධම්මවිනයට එකඟනම් කැපයි එසේනැත්නම් අකැපයි, අමථිතකප්පනම්, යම්කිරක් කිරිබැව්න් තොරනම් දීබවටත් නොපැමිණියේනම් එසේවූදෙය පවාරිතවූවහු විසින් කැපකරවා නොගෙණ පීමයි මෙද පචිතිකරයි, මෙහි ජළොගිපාතු කල්පයනම්, යම්සුරාවක් මත්වෙනබවට නොගියේනම් එතුභව්දූ පීමයි * මෙද පචිතිකරයි, දශවලුනැති නිසිදනය කැපය යුතු එකෙකි, ඒ නොකැපයි, පරිහරණයකළ පචිතිකරයි, ජාතරූපරජතය කැපයයුතු දසවැන්නයි, මේ පිළිගත පචිතිකරයි, මෙසේ දශය විචාරා නැවත නොකැපබැව් නිශ්චය කොටගෙණ මහාවනයෙහි කූටාගාර ශාලාවට එලබ එහිදීත් මෙසේ පුච්ඡා විසජ්ජනයෙන් සඟමැද විනිශ්චය කළහ, දෙවන සඞ්ගීතියට නිදාන මෙසේයි.

---

* සමහර පොතෙක ජලෝගිසි පෙණෙයි.

# ERRATA.

## ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| 2 | 18 | විල | විල |
| „ | 33 | හසින් | ඉතා හසින් |
| 3 | 9 | (එකල්හි දෙවියෝ | (එකල්හි දෙවියෝ) |
| „ | 21 | ලද්දවූ | ලද්දවූ |
| „ | 28 | පාෂාණයකින් | පාෂාණයෙන් |
| 6 | 14 | කරුණාව | කරුණාවවේවා |
| „ | 21 | නාගරජයෙනි | නාගරාජයෙනි |
| „ | 33 | සිවුරු | සිවුර |
| 10 | 18 | වේවයි | වෙවයි |
| „ | 30 | සියලු | ධුරන්ධරවූ සියලු |
| 17 | 1 | යන | යනමේ |
| 25 | 17 | තෙතෙමේ | තෙමේ |
| „ | 27 | යෙන් | යෙන්කල්වූයේ |
| 32 | 18 | කම්පාවෙක් | කම්පාවක් |
| „ | 19 | කම්පාවෙක් | කම්පාවක් |
| 33 | 12 | කියේය | කියා |
| „ | 14 | සමගි | සමගිව |
| 34 | 6 | ගිජුවූ | ගිජුවූවාය |
| „ | 17 | ඇළුනේ | ඇළුනේ ඇය |
| 35 | 32 | ප්‍රසිඬබැවිනුත් | සතුටුවූවෝ |
| 36 | 4 | නම | නම සියල්ලෝ පුතුන්දෙතිසෙක |
| 37 | 6 | පමනින් | පමණින් |
| 38 | 31 | ගැසුව | නැසුව |
| 39 | 3 | ගෙයකින් | ගෙයකින් තඹවන්බිම දුහුවිලෙන් සපශ්කල |
| „ | 32 | සැපසු | සම්බවූ |
| 40 | 19 | පුතුන | පුතුන් |
| 43 | 2–3 | මිනිසුන් | මිනිසුන් සියයක් |
| „ | 14 | දීඝායු | දීඝායුස් |
| „ | 15 | දීඝායුග්‍රාම | දීඝායුර්ග්‍රාම |

| පිට. | පෙළ. | අශුබ. | ශුබ. |
|---|---|---|---|
| ,, | 24 | මුක්තාබැවින් | මුක්තාපමණින් |
| 94 | 20 | මුත්තාගේ | ආයසී |
| 95 | 17 | ගත්තාය | ගත්තාය |
| 96 | 29 | නැගි | නැගිඹගු |
| 98 | 8 | දේවිය | දේවියගොස් |
| 99 | 10 | බඹුසහිත | සැතිය යෝධයෝ |
| 101 | 37 | පෙළිය | ගෙළිය |
| 102 | 1 | කුඹ්ඃගත | කුටුඹියගත |
| ,, | 24 | උන් | උස්උන් |
| 103 | 4 | කුරුවෙත | කුමරුවෙත |
| ,, | 10 | වැවක් | මහවැවක් |
| 104 | 20 | කොට | කොට එකල |
| 105 | 8 | සපපදුරු | කප්කදුරු |
| 106 | 3 | චාලනය | ඔහු චාලනය |
| ,, | 31 | සැවිර | ඒසැවිර |
| 108 | 23 | නම්වි | නමින් පතළවී |
| 109 | 5 | ලගටුදුකල | දූලගටු දුමන කල |
| 112 | 14 | විවාළේය | ඔහු විවාළේය |
| 114 | 25 | කරවූයේය | කරවූයේය ඒසතුපය සිහාරා<br>විහාරයක්ද කරවිය |
| 115 | 19 | ඉක්බිතෙතාත් | ඉක්බිති ඒ රජතෙම |
| ,, | 26 | නැවතද | නැවතද නානාරත්නාලඞකෘත |
| 116 | 21 | අඹබඞක | අඹලඞක |
| 117 | 10 | වැඹින් | රුවන්මුවාවැඹින් |
| ,, | 12 | වේදිකාවක් | පබලුවේදිකාවක් |
| 118 | 20 | උදුරවූ | අතිඋදුරවූ |
| 119 | 4 | අණකෙළේය<br>(කීතැනට) | ගැමුණුරජතෙම චෛත්‍යයට<br>ගැඩොල් පිණිස සිතූයේය |
| ,, | 12 | මෙසේ | හෙතෙම මෙසේ |
| 163 | 9 | මිහිපල් | ඒ මිහිපල් |
| ,, | 33 | ගෙණ | ගෙණ දකුණුදෙරින් |
| 164 | 1 | නැවත | නැවත රජහට |
| ,, | 22 | පිළිම | පිළිම තුණක් |
| 165 | 27 | පිදිය | මහසෑයෙහි පිදිය |
| 166 | 7 | සත්තිස් | සත්විසි |
| 167 | 23 | නුවරට | නුවරටම |
| 168 | 11 | මහඇමැති | විනිශචය මහඇමැති |

# INDEX.

# ම හා වං ස ය.

## ශූ චි ප ත්‍ර ය.


| පිට. | පෙළ. | කාරණයන්ගේ වෘත්තාන්තය. |
|---|---|---|
| 1 | 1 | උපන්‍යාසය |
| „ | 13 | සූවිසි විවරණය |
| 2 | 3 | සම්‍යක්සම්බොධිකථාදීය |
| „ | 15 | බුදුන් ලක්දිවටවැඩි 1 වෙනි ගමන (මහියඞ්ගනාගමන) |
| 4 | 4 | දෙවෙනි ගමන (නාගදීපාගමන) |
| 5 | 25 | තුන්වෙනිගමන(කල්‍යාණාගමන) |
| 6 | 26 | මහාසම්මත වංශය |
| 8 | 9 | බොධිසත්වාදිප්‍රවෘත්තිකථා |
| 9 | 1 | බුද්ධපරිනිර්වාණයහා ප්‍රථම සඞ්ගීතිය |
| 11 | 28 | අජාසත්ආදි රාජවංශය |
| 12 | 13 | (කාලාශොක රජකාලයෙහි) දෙවෙනි සඞ්ගීතිය |
| 16 | 20 | ආචාර්‍ය්‍යවංශකථාව |
| 17 | 19 | කාලාශොක රජහුගේපරම්පරාව |
| „ | 32 | ධර්‍මාශොක රජහු අභිෂෙක කථාව |
| 18 | 26 | නිග්‍රොධ සාමණෙර කථාව |
| 22 | 14 | මොග්ගලිපුත්තතිස්සස්ථවිරයන්වහන්සේගේ පිළිවෙළ කථාව |
| 26 | 7 | තුන්වෙනි සඞ්ගීතියේනිදානකථාව |
| 33 | 14 | තුන්වෙනි සඞ්ගීති කථාව |
| 34 | 1 | විජයරජහුගේ උත්පත්තිකථාව |
| 36 | 7 | විජයරජහුගේ ආගමනකථාව |
| „ | 30 | විජයරජහු අභිෂෙකකථාව |

| රජ ගණන. | පිටු | පෙළ. | ප්‍රවෘත්ති. | බුද්ධ වර්ෂ. | රාජ්‍ය වර්ෂ. | මාස | දින |
|---|---|---|---|---|---|---|---|
| 1 | 39 | 1 | විජයරජහු රාජ්‍යය | 1 | 38 | 0 | 0 |
| 2 | 14 | 8 | විජයාමාත්‍යයන් රාජ්‍යානු ශාසනාව | 39 | 1 | 0 | 0 |
| | ,, | 11 | පඬුවස් දෙව්කුමරහු ඒම | | | | |
| 3 | 42 | 18 | පඬුවස් දෙව්රජහු රාජ්‍යය | 40 | 30 | 0 | 0 |
| | 43 | 6 | ලක්දිවරාමගොණ අනුරාධාදි ගම් පිහිටි ක්‍රමය | | | | |
| 4 | 44 | 14 | අභයරජහුගේ රාජ්‍යය | 70 | 20 | 0 | 0 |
| | ,, | 19 | පණ්ඩුකාභය කුමරුවැඩීම | | | | |
| | 47 | 5 | අභයරජු විසින් සියරජය මලනුන්ට පාවාදීම | | | | |
| (5) | ,, | 6 | රාජශූන්‍යවූ (තිසකුමාරයා ප්‍රධානවූ) කාලය | 90 | 17 | 0 | 0 |
| | ,, | 31 | පණ්ඩුකාභය කුමාරයාගේ යුද්ධය | | | | |
| 5 | 48 | 18 | පණ්ඩුකාභය රජහුගේ රාජ්‍යය | 107 | 70 | 0 | 0 |
| 6 | 50 | 1 | මුටසිව රජහු | 177 | 60 | 0 | 0 |
| 7 | ,, | 14 | (දෙවානම්පියතිස්ස) දෙවැනි පෑතිස් | 237 | 40 | 0 | 0 |
| | ,, | 16 | ඔහුගේකාලයේවූ අරුම | | | | |
| | ,, | 34 | දෙවැනිපෑතිස් රජහා දඹදිව දම්සෝරජහු මිතුරුදම් | | | | |
| | 52 | 2 | දෙවැනි පෑතිස් රජහු දෙවැනි අභිෂෙකය | | | | |
| | ,, | 15 | බුද්ධාගම නොයෙක් දේසවල පිහිටුවීම | | | | |
| | 55 | 24 | බුද්ධාගම ලක්දිවට ගෙණඒම | | | | |
| | 57 | 1 | මහෙන්ද්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් දෙවැනි පෑතිස්රජහු පැහැදවීම | | | | |
| | 59 | 16 | උන්වහන්සේ අනුරාධපූරයට ප්‍රවිෂ්ටවීම | | | | |
| | 60 | 31 | මිහිඳුමාහිමියන්ගේ ධර්මකථාදිය | | | | |
| | 64 | 7 | සිව්බුදුවරයන් මහමෙවුනඋයනට වැඩිය කථාව | | | | |

හෙයින් නුඹලාත් ඒ අනුමෝදන් වච්ය" සි කීයේය, ඒ වැඩි
59 මහලු සහෝදරතෙම නොසතුටු සිත්ඇතියේ "සැමකල්
හිම චණ්ඩාලයෝ කසාවත් හඳනාහුය, මෙතෙම චණ්ඩාල
යෙක් වන්නේද්‍යෙහෝසි" කීයේය. මධ්‍යම තැනැත්තේ
60 "ඒ පසේබුදුන් මුහුදින් එතරදම" සි කීයේය, ඒ මධුදායක
යාගේ බස්අසා ඔව්හු ප්‍රාප්තිදානය අනුමෝදන්වූහ.
61 ඒ සල්පිළ දැක්වූ ඝටචෙටිකාතොමෝ වනාහි ඒ මධුදාය
කයාගේ මෙහෙසි බැව්හා නොපෙණෙන සන්ධිඇති ඉතා
62 මනොහරවූ රූපයද ප්‍රාර්ථනාකළාය. මධුදායකවූ වෙළඳ
තෙම ධර්මාශෝකනම් රජවූයේය, ඝටචෙටිකාතොමෝ
අසන්ධිමිත්‍රානම් දෙවී විය, චණ්ඩාලවාදීවූ වෙළඳතෙම
නිග්‍රොධ සාමණේර වූයේය, පාරවාදීකවූ වෙළඳතෙම
63 දෙවැනි පැතිස්නම් රජවූයේය. යම්හෙයකින් මෙතෙම
චණ්ඩාලවාදි වීනම් එහෙයින් සැඬොල්ගම උපන්නේය,
යම්සේ මොක්ෂය ප්‍රාර්ථනාකෙළේද, එහෙයින් සත්හැවිරිදි
64 වයස් ඇත්තේම මොක්ෂප්‍රාප්තද වූයේය. එහෙයින් ඒ සාම
ණේරයන් කෙරෙහි පිහිටි ප්‍රෙමඇති ඒ රජතෙම, ඉතා දැහු
65 සුළුවූයේ ඔහු කැඳවූයේය, මෙතෙම සංසුන් පැවැතුම් ඇත්
තේම ලඟට පැමිණියේය, රජතෙම දරුව සුදුසු අස්නෙක
හුනමැනවැසි කීයේය. මෙතෙම අන්‍යවූ ශ්‍රමණයෙකු නො
66 දැක සිංහාසනයකරා පැමිණියේය, ඒ සාමණේරයානන්
පය්‍යඞ්කයකරා එනකල්හි රජතෙම "අද මේසාමණේර
තෙම මාගේ ගෙයි ස්වාමිවන්නේය" සි සිතූයේය. මෙතෙම
67 රජහු අතඅල්වා පය්‍යඞ්කයට නැංගේ රාජපය්‍යඞ්කයෙහි
68 සේසතයට වැඩහුන්නේය. ඒ ධර්මාශෝක රජතෙම එසේ
හුන්නාවූ ඒ සාමණේයන් දැක, ගුණයෙන් සම්භාවනා
69 කොට, එකල අතිශයින්ම සතුටුවූයේය. ඒ සාමණේරයන්
තමන්ට පිළියෙල කරණලද ඛාද්‍යභොජ්‍යයෙන්සතපා, සම්
70 බුදුන් වදාළ ධර්මයක් විචාළේය. ඒ සාමණේරතෙම ඒ රජ
හට දම්පියායෙහි අප්‍රමාද වර්ගය වදාළේය, ඒ මිහිපල්තෙම
71 ඒ අසා බුද්ධශාසනයෙහි ප්‍රසන්නවූයේ "දරුව නුඹවහන්
සේට නිත්‍යබත් අටක් දෙමැ" සි ඒ ගෙරණුන්දූට කීයේය,
ඒ සාමණේරතෙම "මහරජ ඒ නිත්‍යබත් මාගේ උපාධ්‍යා
72 යන්ට දෙමැ" සි කීයේය. නැවත අටක් දුන්කල ඒ අට
ආචාරීන්ටද, නැවතත් අටක් දුන්කල්හි ඒ අට භික්ෂුසංඝ
73 යාටද ඒ සාමණේරතෙම දුන්නේය. නැවතත් අටක් දුන්
කල්හි ප්‍රාඥවූ සාමණේරතෙම ඉවසූසේක. දෙවෙනි දවස්
හි භික්ෂූන් දෙතිස්නමක් ගෙණ රජගෙට වැඩිසේක. රජහු

සඞ්ඛිත හස්තක් කුමරහට (එවනුයේ) "තෝ ගහින් එතර
49 අනුභවකර ඉන් මොබ නගරෙක් එව" යි කියා යැවීය.

50 රජ්ජුගේ බෑයෝ නවදෙනා ඒ අසා රජහට කිපියෝ
"තෙපිම බොහෝකලක් ඔහුට උපකාර වෙහිය දූන් රට
51 දෙහි එහෙයින් තොප මරනනමුය" යි කිවුය. ඒ රජ උන්ට
රජය පාවාදුන්නේය. ඒ සියල්ලෝ එකගව තිස්සනම් බෑයා
52 රජයට ප්‍රධානකළෝය. අභයදයක මේ අභය රජතෙමේ
විසිහවුරුදුක් ඒ උපතිස් ගම්හි වෙසෙමින් රජයකෙ
ළේය.

53 දුම්රක්ගල වසන චේතියා නම් යකිනී තිඝිරියගන
54 විලෙහි වෙළඹරුවින් ඇවිදිනිය. සුදුසිරුරු හා රත්පාඇති
55 සිත්කළු ඒ වෙළඹ එකෙක් දැක "මෙහි මෙබඳු වෙළඹක්
වසනනිය" යි කුමරහට දැන්වීය. කුමරතෙමේ රැහැණගෙ
ණ ඇය අල්වාගන්ට එලඹියේය. පශ්චාත්භාගයෙන් ආවහු
56 දැක ඒ කුමරහු තෙදින් ඕතොමෝ හයද්වා අතුරුදහන්
නොවී දිවුවාය. ඒතෙමේ දුවනනිය ලුහුබැන්දේය. දුව
නනාවූ ඕතොමෝ ඒ විල සිසාරා සත්යලක් දිවුවාය. මහ
57 ගඟ බැස එයින් එතරව නැවත සත්යලක් දුම්රක්
58 ගල සිසාරා දිවුවාය. නැවත එම විල වටා තුන්යලක් දිවූ
59 වාය. එයින් ඉක්බිති කච්ඡකනම් තොටින් ගඟට බටුවාය.
ඒතෙමේ එහිදී වාලධියෙහි ඇයද ගඟෙහි යන තල්පතක්ද
ගත්තේය. ඔහුගේ පින්තෙදින් ඒ තල්පත මහ කඩුයෙක්
60 විය. ඈට "නී මරමී" කියා කඩුව එසවීය "ස්වාමීනි ඔබට
රජය ගෙණදෙමි මා නොමැරුව මැනව" යි කීවාය. ඒ
61 තෙමේ ඇය ග්‍රීවයෙහි අල්වාගෙණ කඩුපිලින් නාසායෙහි
62 විද යොතින් බැන්දේය. ඈ වසහවී. මහත් බලඇති ඒ
තෙමේ වෙළඹනැගී දුම්රක්ගලට ගොස් එහි සතර අවුරුද්
63 දක් වාසයකෙළේය. හටසේනා සහිතවූයේ රිටිගලට අවු
දින් යුද්ධකාලය බලමින් එහි සත්අවුරුදුක් වාසයකෙ
ළේය.

64 මසිලන් දෙදෙනාකුහැර ඔහුගේ සෙසු අටමයිල්ලු යුද
65 යට සැරසුණෝ ඒ රිටිගලට එලඹ (එහි පෙරපිහිටි) කඳාවුව
66 ර කඳවුරු පිහිටුවාගෙණ සිවුරඟ සෙන් දී සෙනෙවියා යවා
භාත්පසින් රිටිගල වටලෑවූය. යකිනියගේ මන්ත්‍රණයකොට
ඈගේ වාචොයුක්තියෙන් රාජපරිෂ්කාර පඩුරු ආයුධයන්ද
67 දී "මේ සියලු උපකරණයන් ගණිව් මම තොප ක්ෂමාකර
වනෙනෙමි" මෙසේ කියා කුමාරතෙමේ පෙරතුව බලසෙන්
68 යැවීය. "ප්‍රවිෂ්ටවූ ඔහු ගනනෙමෝය" යි ඔවුන් විශ්වාසවූ

HARVARD COLLEGE LIBRARY

සුදුස්සේය අතිකොත් නුසුදුස්සේය, එහෙයින් මේ රුවන්
19 ඔහුට දෙන්නෙමැ"යි සිතුය. දෙවෙනි පැතිස්සය දම්සෝය
යන මේ (මිහිපල්හු) දෙදෙනා බොහෝකල් පටන් අදුණ
මිත්‍රයෝය. ඉක්බිති ඒ (දෙවෙනි පැතිස්) රජතෙමේ බෑ
20 ණවූ මහාරිෂ්ට නම් ඇමැතියා ප්‍රධානකොට බමුණය ඇමැ
21 තියාය ගණකය යන ඒ සතරදෙනා බලසමූහයෙන්
22 පිරිවරණලදුවන් දූතයන් කොට මැණික්ජාති තුනය ඒ
තුන් රථයෂ්ටිහුය දක්‍ෂිණාවෘත්ත ශඞ්ඛය යටකී අවජාති
23 මුතුය යන මේ අනගි රත්නයන් අතවදී (දම්සෝ රජුවෙත)
යවූයේය. ඔව්හු දඹකොළ පටුනෙන් නැව්නැගී සැපයේ
සත්දවසකින් (මුහුදුපිට ගොස්) තොටලැබ පසුව ඉන් සත්
24 දවසකින් පැළලුප්නුවරට පැමින දම්සෝ රජහට පඩුරු
දුන්හ. ඒතෙමේ ඒ දැක සතුටුවිය.
25 "මෙබඳු රත්නයන් මෙහි මට නැත්තාහ"යි මෙසේ
26 සිතා සතුටුවූ රජතෙමේ අරිට්ඨනම් (කුමරහට) සෙනෙවි
තනතුරුද බමුණට පෙරෙවිබැව්ද දුන්නේය. ඒ ඇමැතිය
27 හට වනාහි දණ්ඩනායක තනතුරුද ගණකයහට සිටු තන
තුරුද දුන්නේය. ඔවුන්ට අනල්ප භොගයන්ද වාසයට
ගෙවල්ද දී ඇමැතියන්හා මන්ත්‍රණය කොට ප්‍රතිපඩුරු දැක
28 වල්විදුනාය මගුල්කඩුව ඡත්ත මිරිවැඩිසගල ඉස්වෙළුම
පාමගය කෙඩිකාව හරිපඬ්වතයෙහි හටගන්නා සඳුන
29 නොදෙව්නා කෙළක් පිළිය මාහැඟි අත්පිස්නාය නයින්
30 විසින් ගෙනෙනලද අජනය අරුණුවන් මැටිය අනෝ
තත්ත විලින් ගෙණ ජලය ගඟාජලය සක්ගෙඩිය නන්දාව
31 වෘත්තය වර්ධමානකය කුමාරිකාය රන්බඳුන් බඳුය මාහැඟි
32 සිවිකාය මාහැඟි අරළු නෙල්ලිය අමාඔසුය ශුකනාහෘත
33 ඇල් හැටදහසක් අමුණ පිරිවරින් වෙසෙසනලද අභිෂෙ
කොපකරණයන්ද දී නරෙශ්වරතෙමේ සුදුසු කාලයෙහි යැ
ලූවාට පඩුරුත් මේ මතුකියන දහම් පඩුරුත් දී දූතයන්පෙ
34 රලා එවූයේය. "මම බුදුන් දහම් සඟ සරණ ගතද්දෙමි
ශාක්‍යපුත්‍ර බුදුසසුන්හි උපාසකබැව් ගිව්සෙම් නරෝත්ත
35 මය තෙපිද ශ්‍රද්ධාවෙන් සිත පහදගෙණ මේ ඇණුරුවන්
36 සරණ යව. නැවතත් මාගේ යහලුවාහට අභිෂෙක කර
ව"යි කියා යහලු දම්සෝ රජතෙමේ සත්කාරකොට ඒ
ඇමැතියන් එවී.
37 ඒ ඇමැතිදූතයෝ ඉතා සත්කාර කරණුලද්දෝ පස්මසක්
එහි වැස වෙසක්මස ශුක්ලපක්‍ෂයෙහි පැලවියදා පිටත්වූ
38 වෝ, දමලිපතියෙහිදී නැව්නැඟී දඹකොල පටුන බැස

වරින් සුනීයාරාමයකරා පැමිණියේය. එහි වසනාවට
190 යොග්‍යවූ ස්ථවිරයන්කරා එළඹ වැඳ ස්ථවිරයන්හා සමග
උඹගඟ තොටට ගොස් රන්නගුලක් ගෙණ එතැන් පටන්
191 සාමින් ගිණේය, මහාපදුමය, කුඤ්ජරය යන නම් ඇත්තාවූ
අතිශයින් ශොභනවූ ඇත්දෙදෙන ස්වර්ණමයවූ . නගු
192 ලෙහි යොදනලද්දුය. පළමුවෙනිවූ කුන්තමාලකයෙහි
193 (සිව්යේ) සිවුරඟ මහසෙනග ඇත්තාවූ සතුරු දමනයකළ
194 මිහිපතිවූ නරේන්ද්‍රතෙම ස්ථවිරයන් සමගවූයේ මොනවට
සරසනලද්දාවූ පූර්ණකලශ, නොයෙක් වර්ණඇත්තාවූ කො
ඩිය, යහපත්වූ සඳුන්සුණුපුන් තලිය, රන් රිදී දඬුඇති
195 කැටපත්ය, මලින් බරවූ සුමුගුය, මල්ඇගෑය, තොරන් කෙ
සෙල් ආදියද ගත් අත්ඇති අඟනන් විසින් පිරිවරණ
196 ලද්දේ නොයෙක් තූර්‍ය්‍යයෙන් ඝොෂණය කරණලද්දේ සේ
නාසමූහයා විසින් පිරිවරණලද්දේ ස්තුතිමඞ්ගලගීතයෙන්
197 සිවුදිගුන් පුරවනොත් සාධුකාර නාදයෙන්හා පිළිහිස සියැ
රුම් සියගණිනින්ද මහත්වූ උත්සව පූජයෙන්ද යුක්තවූයේ
198 නගුල රැගෙන සිව්වුදක්වා සාමින් ගියේය. විහාරයහා
නගරයද ප්‍රදක්ෂිණකරනොත් ගංතොටට පැමින සීමාව
199 යනතැන් සමාප්තකෙළේය. එහි සීමාතොමෝ කවර නිමි
ත්තකින් ගියාදැයි "සීමාව පැමිනිතැන් (දැනගණු) කැමැ
200 තෙතනි ඒ මෙසේ අවබොධ කරව්" (කොළොම් ගොය)
පසන්තොට පසෙණහි කුඩාවලටද එතැනින් කුම්බලනම්
201 වළ අගටද එතැනින් මහදූවටද ගියාය. එතැනින් කුඩුක්
පෙලට ගියේ, එසින් මහඅම්ලුවට ගියේය, එසින් කුදුම්රුක
වද එතැනින් මුරුතපොකුණටද ගියේ විජයාරාමනම්
202 උයනෙහි උතුරු දොරකොටුවට ගියේය, ගජකුඹුනම් ගල
වද, තුසවැව්ය මැද්න් අබාඋයනෙහි කොත්ගලටද (මහා
203 ස්) මහසොහොන මැදට ගියේය, දීඝුපසනට ගොස් ක
ම්මාරදෙවයාගේ ඔඩහැලට වමින් හුගමළුවට ගොස් හිය
204 ගල සමීපයෙහි ගිනිකොණ දියවස්ඛණගේ දෙවාලය
වද, එතැනින් තෙලුම්පෙලට ගියේ, එතැනින් තාලචතු
205 ෂ්කයට ගියේය, එතැනින් අස්මඩුලුලට වමින් සසවානයට
206 ගියේය, එතැනින් බොරඑතොටටගියේ එතැනින් මතො
හි නදියට ගියේය, පළමු සැයෙන් නැගෙණහිරද කො
207 ළොම්ගස් දෙකක් වූහ, සෙනිඥගුත්ත රාජ්‍යයෙහි උදක
ශුඩික ද්‍රවිඩයෝ නදිය දුරයයි සිතා බැඳ එය නුවරට ආස
208 න්නකළහ. එහි ජීවමානවූ කොළොම්රුක සීමාවට ඇතු
ළුකොට ගියේය, මළ කොළොම්රුක පිහිටි ඉවුරෙන් සීමා

එසේම මහත් අභිඥා ප්‍රඥා ඇති සඞ්ඝමිත්‍රා නම් මහාථෙ
50 රීතොමෝ සහුන් තිසද බොහෝවූ ලෝවැඩද කොට
51 එකුන් සැටවස් ඇතිව උත්තිය නම් එම රජහුගේ නවවෙනි
බෙම නම් හවුරුදුයෙහි ඇතාල නම් මෙහෙණවර වසන්නී
52 පිරිනිවන්පෑවාය. රජතෙමේ ඒ මෙහෙණීන්වද තෙරුන්ට
සෙයින් සත්දවසක් මුළුලෙලෙහි උතුම්වූ පූජාසත්කාර එක
ළෙසි. මහතෙරහුවන්ට සෙයින් සකල ලඞ්කාවිපය අල
53 ඞ්කාර කරණලද්දේ වී. කුළුගෙයෙහි තගණලද තෙරණී
සිරුර සත්දවසක් ඇවෑමෙන් නුවරින් පිටත්කොට ථූපා
54 රාමයට නැගෙණහිරින් චිත්‍රසාලා සමීපයෙහි මහාබොධි
55 උපාශ්‍රයෙහි තෙරණී විශුතැන ගිනිකිස කරවී. ඒ උත්තිය
මිහිපල්තෙම එහි සෑයකුදු කරවී.
56 මහෙන්ද්‍රස්ථවිරාදී ඒ පස්මහතෙරහුද අරිෂ්ටස්ථවිරාදීහුද
එසේම නොයෙක් දහස්ගණන් භික්ෂූහුද සඞ්ඝමිත්‍රාව ප්‍රධාන
57 කොටඇති ඒ දෙලොස් තෙරණීහුද බොහෝ දහස් ගණන්
රහත් භික්ෂුණීහුද බොහෝ ඇසූපිරූතැන් ඇත්තාහු මහ
58 පැණ ඇත්තාහු විනයාදී බුඩාගම බබුළුවා හුදුහුකල අනි
ත්‍යතා වසහයට ගියෝසි. ඒ උත්තිය රජතෙමේ දසහවු
රුඅදක් රජකම් කෙළේය මෙසේ මේ අනිත්‍යතාතොම සක
ල ලෝකය නසන්නීය.
59 අතිශයින් ලාභලා ක්‍රියාකරන්නාවූ ඉතා බලඇති වල
කාලිය නොහෙන්නාවූ ඒ මේ අනිත්‍යතාව යම් මිනිසෙක්
තෙමේ දනෙන්ම සසර ගමන්හි කලනොකිරේද, කලකිරූ
ණේත් පාපයෙන් තොරවීමත් පින්හා ඇල්මත් නොකෙ
රේද; දනිමින්ම දුඃඛයේ මූලාවේයසි යන මෝතොමෝ ඔහු
ගේ අධික මෝහරාසියෙහි බලබවසි.

මෙතෙකින් හුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වස ථෙරපරිනිබ්බාණ නම් විසිනවනි අදියර නිමි.

---

# 21 වෙනි පරිච්ඡේදය.

1 ඒ උත්තිය රජු ඇවෑමෙන් ඔහු තිස්දෙවුන්වල් මහාසිව
රජ හුදනන් සෙවුනේ දසහවුරුඅදක් රජය කෙළේය. ඒ
2 රජතෙමේ හඳුහාල තෙරුන් කෙරෙ පැහැද සිත්කලුවූ
නගරහන විහාරය පෙරදිග කරවී.

සිතා මේ භාගය අනුභව කරව්යයිද "අපි දෙබෑයෝ
82 හැමකල්හි උහුන් අද්‍රෝහ වන්නෙමුය"සි සිතා මේ භාගය
අනුභව කරව්ය"සිද මේ කීයේය. දෙනනාම ඒ භාග
වය අමාවක්සේ අනුභව කෙළෝය. "දෙමළුන්හා යුධ
83 නොකරන්නෙමුය"සි (සිතා) මේ අනුභව කරව්ය"සි මෙසේ
කීකල ඒ තිස්සකුමර ආහාරය අතින් දැමීය. ගැමුණු කුමර
84 තෙමේ බත්පිඩ දමා ඇඳට ගියේ අත්පා හකුළුවාගෙණ
ඇඳෙහි වැතිරගත්තේය. දේවිය ගැමුණු කුමරු සතුටු කෙ
85 රෙමින් "දරුව අත්පා හෙලා ඇඳෙහි සැපසේ කුමකින්
නොනිදයිද"සී මෙසේ කීවා ඒතෙමේ "ගඟින් එතර දෙම
86 ළුය මේ දියින් මහා ගොළුමුහුදය මම කෙසේනම් ප්‍රසා
රිතාඞ්ග ප්‍රත්‍යඞ්ග ඇතිව නිදම්දැ"සි කීයේය. ඒ කුමරහු
87 අභිප්‍රාය අසා මීහිපල්තෙමේ තුෂ්ණීම්භූතවී. ඒ කුමර
ක්‍රමයෙන් වැඩෙන්නේ පින්යසස් සෙධයසී ඇතිව තේජස්
බලපරාක්‍රමයෙන් යුක්තව සොළොස් ඇවිරිදිවීය.
88 සත්වයෝ තුමූ සංසාර ගතිය ඉතා චමලකල්හිත් පින්
කරණකොටගෙණ රුචිපරිද්දෙන් (මනුෂ්‍යාදී) ගතියකට
එළඹිගණිති, නුවනැත්තේ මෙසේ මෙබව දැන කුසල් රැස්
කිරීමෙහි මයත් ආදර හෝ ගෞරව ඇතිවන්නේය.

සමිතෙකින් සුදීජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වංශ ගාමණිකුමාර පසූතිනම්වූ දෙව්සිවන අදියර නිමි.

---

# 23 වෙනි පරිච්ඡේදය.

1 ඒ කඩොලෑත්තෙමේ බල ලක්‍ෂණ රුචිත්හා තේජස්
2 ජව ගුණයෙන්ද අග්‍රවූයේ මහාකඳ ඇතිවිය. ඒ ගැමුණු
කුමරහට නන්‍දිමිත්‍රය සුරනිම්ලය මහාසෝණය ගොඨඹිම්
3 බරය ථෙරපුත්තාභය භරණය වේළුසුමනය එසේම ඛඤ
දේවය පුස්සදෙවය ලභියවසභයයි යන මහා බලඇති මේ
දසමහා යෝධයෝ ඇතිවූහු.
4 එළාල රජහුගේ මිත්‍රනම් සෙනෙවියෙක් ඇත්තේය. නැ
ගෙණහිරි කඩරෙද (නම් රට) ඒ සෙනෙවියා කම්මාන්ත
5 ගම්හි සිත්පව් සම්පයෙහි බුහුනනියන් පිතෙක්වී. (ඒතෙ
6 මේ) කෝසෝහිත වණුගුයා ඇත්තේ මසිල්හු නම් ඇතිවී.
දුරද බඩගායන ඉනා ලදරු ඒ කුමරහු කවියෙහි විරපවින්

නැඟී, සරසනලද්දාවූ යහපත් කඹලාතු පෙරටුකොට රන්
40 කරඬුවක්ගෙනෝ ජේසනයට සිටියේය. අවතුරු දහසක්
පුරුෂයෝද, යහපත් පුන්කලස් හා ආභරණ ඇත්තාවූ යහ
41 පත් ස්ත්‍රීහුද ඒ රථය පිරිවැරූහ. ඒ ඒ පමණවූ නානාවිධවූ
මල්සුඹුහුද එසේම දඬුවැට පහන්ද දරාගෙණ ස්ත්‍රීහු පිරිවැ
42 රූහ. මොනවට සරසනලද්දාවූ අවතුරු දහසක් ලදරුවෝ
43 නානාවර්ණවූ යහපත් ධ්වජයන් ගෙණ පිරිවැරූහ. ඒ ඒ
තන්හිවූ නානාවිධ තූර්ය්‍යශබ්දයෙන් හා අනේකවිධවූ හස්ත්‍ය
ශ්ව රථ ශබ්දයෙන්ද පොළෝතල කිඳීහුලබනයේවූ කල්හි,
44 සොභාවෙන් යුක්තව මහමෙව්නා උයනට යන්නාවූ ඒ මහා
යසස්ඇති නගරේන්ද්‍රතෙම නදුන්වන වදනා සක්දෙව්රජහු
45 සෙයින් බැබලීය. පිරිවෙණ වැඩහුන් සොණුත්තර යති
තෙම රජහුගේ නිෂ්ක්‍රමණාරම්භයෙහි නගරයෙහි මහත්වූ
46 තූර්ය්‍යශබ්දය අසා, පොළොව කිමිද වහා නාගභවනයට වැඩ
එහි නාරජහු ඉදිරියෙහි පහළවූසේක.
47 නාරජතෙම හුනස්නෙන් නැඟී වැඳ උන්වහන්සේ පලු
48 ගෙහි හිඳුවා සත්කාරකොට ආවාවූ දෙශය පිළිවිසියේය.
එය වදාළකල නැවතත් තෙරුන්වහන්සේ වැඩිය කරුණ
49 විචාලේය, ඒ ස්ථවිරතෙම සියලුම කරුණු කියා සඞ්ඝයාගේ
හස්න වදාලේය. "සර්වඥයන්වහන්සේ විසින් මහා ථූප
යෙහි නිධානකරණු පිණිස නියමකර වදාරණ ලද්දාවූ ධාතු
50 හු මෙහි තොපගේ හස්තප්‍රාප්තවූහ, ඒ ධාතුන් තෝ මට
දෙව" ඒ අසා අතිසසිත්ම නොසතුටු සිත්ඇත්තාවූ නාග
රාජතෙමේ "මේ ශ්‍රමණ තෙම බලාත්කාරයෙන් ගන්නවද
51 සමර්ථය එහෙයින් ධාතූහු අන්තැනෙක පැමින වියයුතු
ය" යි සිතා එහි සිටි බෑනනුවන්ට ආකාරයෙන් දැන්වූයේය,
52 නම්න් වාසුලදත්ත නම් හෙතෙම ඔහුගේ ඉඟි දැන ඒ
චෛත්‍ය මන්දිරයට ගොස් ඒ කරඬුව ගිල මේරුපර්වතපාද
53 යට ගොස් කුණ්ඩලාවර්තව ශයනය කෙළේය. තුන්සියක්
යොදුන් දිඝවූ ශරීරය ඇතිවිය, දරණය යොදුනක් අවට
54 ඇතෙත්ය, නොයෙක් දහස්ගණන් පෙණද මවනලද්දහ.
ඒ මහත් ඍද්ධිමත් තෙම ශයනයකොට දුමනෙත්ය, ගින්
55 නෙන් ප්‍රජ්වලිතවනෙත්ය, නොයෙක් දහස්ගණන් තමන්
සමානවූ නයින් මවා හාත්පස පිරිවරකොට ශයනය කරවූ
56 යේය, එකල්හි බොහෝවූ දෙවියෝද නාගයෝද "නාගයන්
57 දෙදෙනාගේ යුද්ධය අපි බලම්හ" යි එහි රැස්වූහ. මයිල් (නා
රජ) තෙම බෑනනුවන් විසින් ඒ ධාතූහු ගෙණයන ලද්දාහු
යයි සිතා "මාලඟ ධාතු නැත" යි ඒ ස්ථවිරයන්හට කීයේය.

ආලේප කරවා එහි මතුකොට නැටියෙන් මල්වඩු සැය
43 මල්ගුලාවක්සේ කරවිය. නැවතද දූහුල් බොල් මනෝ
සිලා කලලින් සැය ආලේප කරවා පෙර සෙයින්ම මල්ඇවි
44 නිම කරවිය ඉක්බිතිද් හිණිහිස පටන් ධුරවජත්‍රය තෙක්ම
45 මල් රැසිය විසුරුවා ඒ මල්රැසින් සැය වැසීය. අබාවැවින්
යන්ත්‍රයෙන් දිය නගාගෙණ ඒ දියෙන් සැදූඇති ඒ රජ සැය
තෙමමින් ජලපූජාව කරවිය.

46 ආලේප කටයුතු සුණු සියක්ගැලක් මුතෙතන් තලතෙල්
47 හා මුනාකොට ගනවා සුණුකම් කරවිය. පබළු දැලක්
කරවා ඒ සැයෙහි බහා රියසක් පමණ රත්පියුම් (තනවා)
48 සඳුබියෙහි ඝනබියෙහි අවුළුවා එතනින් බිමතෙක්ම මුතු
වැල් එල්වා පියුම්ද එහි එල්වා මහසැය පිදීය ඒ රජ
49 තෙමේ දාගැබ්හි රහතුන් පිරිත් බණන හඬඅසා "මම
එය නොදක නැගී නොසිටිනෙනම්" යි නිශ්චය කරණ
50 ලදුයේ නාගෙණගිරි ගල්වැඩමුල නිරාහාරව හොතෙත්ය.
තෙරුන්වහන්සේලා දොරක් මවා ඒ රජහු දාගැප්කුසට
51 ගෙණගියහ. ඒ මිහිපල් දාගැප් චෛත්‍යයෙහි සියලල දක
බැහැර නික්මුනෝ එබඳුවූම පෙනැලි රුවින් පිදිය. මධු
52 ආරූඩයෙන්ද ගඬ පිඩයෙන්ද; (පියුම් උපුල් කලප් එබ්බු
53 පුත්) කලසින්ද; ගඬ රසයෙන්ද; අඳුන් හිරියල්හා එසේම
මනෝ සිලායෙන්ද; සැමළුවෙහි මනෝසිලා බහා ගොප්මඩ
පමණ සිව්කල (පූජමල්) වස්වා ඉන්පසු අතුරු සිදුරු
54 නැතිව විත්‍රාකසකලු උපුල් මලින්ද; මුළු සැමළුව ගඳකල
ලින් පුරා එහි සිතියම් පැදුරු සිදුරෙහි අවුනනලද උපුල්
55 මලින්ද; එසේම සැමළුව සොරොවූ අවුරා පිරවූ ගිතෙල්හි
නොයෙක් පටපිලි වැටියෙන් දල්වූ පහනින්ද; එසේම මී
56 තෙල්හිද තලතෙල්හිද එපරිද්දෙන්ම පටවැටියෙන් දල්
වනලද බොහෝවූ පහනින්ද; (පූජකෙළේයි)——ක්ෂත්‍රිය
57 තෙමේ කීපරිදිවූ මේදෙසින් වෙන් වෙන්ව සත් සත්වර
බැගින් දාගැප් පූජාව කෙළේය.

58 අවුරුදුපතා නියමකොට කරවනලද උතුම්වූ සුණුපිරි
යුම් මඞගල්‍යය, එසේම ජයමහාබොධිය බොධිස්නානපූජාය,
59 අටවිස්සක් මහ වෙසක්පූජාය, නොමහත්කොට සුවාසූ දහ
60 සක් පූජාය, නානාවිධවූ නැට්වූවන් විසින් කරණලද නැවුම්
හා නානාප්‍රකාර පවාහිත තූර්යනාදය; යන පූජාවන්ගිය
ශ්‍රද්ධාවෙන් මෙහෙයනලද රජතෙමෙ මහසැයෙහි පැවැත්
61 වී. දවස තුන්යලක් බුදුපස්ථානයට ආයේය, ඒ තෙමෙම
62 නියතකොට දෙවරක් මල්පූජායෙහි බෙර හැසිරවී. පෙළ

